පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.15 පැය 1730 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 320 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**සාර්ථක තොරතුරක් ලබා දෙන්නෙකුට රුපියල් මිලියනයක ත්‍යාග මුදලක් පිරිනැමීම - පොලිස් මූලස්ථානය.**

වැල්ලව පොලිස් වසමේ වාසල එපාර්ට්මන්ට්, මරළුවාව ලිපිනයේ පදිංචිව සිටි පුද්ගලයෙකුට 2024.12.24 වන දින රාත්‍රී කාලයේ T56 ගිනි අවියකින් වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධයේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැල්ලව පොලිසිය හා කුරුණෑගල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් මේ වන විට විමර්ශන සිදු කරමින් පවතී.

මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් පිළිබඳව සාර්ථක තොරතුරක් ලබා දෙන අයෙකුට පොලිස් ත්‍යාග අරමුදලින් රුපියල් මිලියනයක ත්‍යාග මුදලක් පිරිනැමීමට වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා තීරණය කර ඇත. එමෙන්ම තොරතුරු ලබා දෙන අයගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා පොලිසිය කටයුතු කරනු ඇත.

ඉහත අපරාධය සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් පහත දුරකථන අංක වෙත ලබා දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

දුරකථන අංක

| | | |
|---|---|---|
| **කොට්ඨාස භාර නිලධාරී, කුරුණෑගල** | **-** | **071 - 8591244** |
| **පොලිස් මාධ්‍ය ප්‍රකාශක** | **-** | **071 - 8591882** |

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**